# ස්මෘති උපක්‍රමයක් ලෙස ථෙරවාද අර්ථාන්විත වනපොත්කරණයේ උපයෝගීතාව

පූජ්‍ය, ඉඹුලමුරේ විමලරතන හිමි[1], පූජ්‍ය, පහලගම ධම්මික හිමි[2]

**හැඳින්වීම**

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම-විනය විධිමත්ව අනාගත පරපුර වෙත සම්ප්‍රේෂණය කිරීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. ථෙරවාද දැනුම් සම්ප්‍රේක්ෂණයේ ප්‍රධාන ආයතනය වන පිරිවෙන ආශ්‍රිත විධිමත් හා අවිධිමත් අධ්‍යාපනය එහි ලා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි. නමුත් නූතන පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත අවසන් පරමාර්ථය වන ධර්ම-විනයෙන් සුපෝෂිත පූර්ණ පෞරුෂයකින් හෙබි භික්ෂුවක් බිහි කිරීම වර්තමානය වන විට සම්පූර්ණ කරගත නො හැකි පරමාර්ථයක් බවට පත්වී ඇත. මේ සඳහා පිරිවෙන් ශික්ෂණවේදයේ පවතින අසමතුලිතතාවන් ඉවහල් වී ඇත. පිරිවෙන් අධ්‍යාපනයේ අවසන් පරමාර්ථය ඉටුකර ගැනීමට නම් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ව පිරිවෙන් ගුරුවරයා මෙන් ම ශිෂ්‍යයා ද සවිඥානික විය යුතු ය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අර්ථවත් ඉගෙනුමක් කරා ප්‍රවේශ විය යුතු ය. නූතන අධ්‍යාපනඥයින් විසින් සාකච්ඡාවට ලක් කරන අර්ථාන්විත ඉගෙනුම (Meaningful Learning) බෞද්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ද පවතින නමුත් වර්තමානයේ අර්ථය විකෘති ව භාවිතයට ගන්නා ආකාරයක් පවතී. බෞද්ධ අධ්‍යාපන සඞ්කල්ප ඔස්සේ ඒ සාකච්ඡා කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අපේක්ෂිත ය.

**පර්යේෂණයේ අරමුණු**

- වනපොත්කරණය හා අර්ථාන්විත ඉගෙනුම් සඞ්කල්ප අධ්‍යයනය කිරීම
- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඔස්සේ සිදු වන ස්මෘතිය පිළිබඳ ථෙරවාද විවරණ අධ්‍යයනය කිරීම
- වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයේ දී සිදු වන වනපෝත්කරණය අර්ථාන්විත ඉගෙනුම් ක්‍රමයක් බවට පත් කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම

**පර්යේෂණ ක්‍රමවේදය**

වණපොත්කරණය හා අර්ථාන්විත ඉගෙනුම පිළිබඳ ව ථෙරවාද බෞද්ධ මූලාශ්‍රය ආශ්‍රයෙන් සිදු කරන මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ සාධාර විශ්ලේෂණ පර්යේෂණ ක්‍රමවේදය (Document Study) උපයුක්ත කරගන්නා ලදී.

**පර්යේෂණ ගැටලුව**

පළමු ධර්මසඞ්ගායනාවේ සිට ථෙරවාද ත්‍රිපිටකයේ ආරක්ෂාව උදෙසා බුදුන් වහන්සේ විසින් දේශිත ධර්ම-විනය භාණක පරම්පරා විසින් කටපාඩමින් පවත්වාගෙන එන ලදී. එය මාතලේ අලුවිහාරයේ දී

[1]. B.Ed. (Hons), (Col), M.Ed. (Pera), M.A. (Kel), තාවකාලික කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.
[2]. (B.A.Sjp), තාවකාලික කථිකාචාර්ය, ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

ග්‍රන්ථාරූඪ වන තෙක් මුඛපරම්පරාගතව පැවතුණි. ඒ සඳහා වනපොත්කරණ ඉගෙනුම් ක්‍රමවේදය අර්ථාන්විත ව යොදා ගන්නා ලදී. ඓතිහාසික පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයෙහි ද වණපොත්කරණය (Parrot Learning) අර්ථාන්විතව යොදා ගැනුණි. වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයේ ද ස්මෘතිය උදෙසා ඒකායන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාමාර්ගය වශයෙන් වණපොත්කරණය යොදා ගැනීම දක්නට ලැබේ. ඉන් ප්‍රජානන ක්ෂේත්‍රයේ පවතින පහළ ස්තරවල ක්‍රියාකාරීත්වයක් පමණක් අපේක්ෂා කරයි. මේ හේතුවෙන් පිරිවෙන් සිසුවා උපාර්ජනය කරගන්නා ලද දැනුම යම් අවස්ථාවක භාවිතයට ගැනීමේ දී එකී සඞ්කල්පයේ මතුපිට ස්පර්ශයක් පමණක් වේ. එය ප්‍රජානනයේ ඉහළ ස්තරයන් වන සංශ්ලේෂණ හා විශ්ලේෂණ තත්ත්වයන්ට මෙන් ම ආවේදන හා මනෝචාලක ක්ෂේත්‍රයන් ද ආවරණය නො කරයි. මේ හේතුවෙන් පූර්ණ පෞරුෂයකින් හෙබි පැවිදි ශිෂ්‍යයෙක් පිරිවෙන් අධ්‍යාපනයෙන් බිහි කර ගැනීම අපහසු වී ඇත. මෙය වර්තමාන ශ්‍රී ලාංකේය ථෙරවාද පිරිවෙන් ක්ෂේත්‍රයේ පවතින ගැටලුවකි.

**පර්යේෂණ සාකච්ඡාව**

වණපොත්කරණය හෙවත් කටපාඩමින් (Parrot Learning) විෂය කරුණු ස්මරණයේ රඳවා ගැනීමේ දී ඉගෙන ගත් දෙය නැවත නැවත සිහිපත් කරමින් මහත් ප්‍රයාසයකින් මතකයේ රඳවා ගත යුතු ය. එහි දී පූර්ණ අවබෝධයකින් තොර ව යාන්ත්‍රික ව ස්මරණයේ රඳවා ගැනීමක් සිදු වේ. නැවත නැවත සිහිපත් නො කිරීමෙන් එකී කරුණු වියැකී යෑම මෙන් ම නව විෂය කරුණු හා මතකයේ පැවති විෂය කරුණු අතර මනා සංයෝජනයක් නො වීමෙන් විෂය කරුණු පැටලිලිසහගත වී වියැකී යෑමේ ප්‍රවණතාවක් පවතී. එසේ හෙයින් වණපොත්කරණයට වඩා ශක්තිමත් ඉගෙනුම් ක්‍රමවේදයක් වන අර්ථාන්විත ඉගෙනුම් න්‍යාය (Meaningful Learning) පිළිබඳ ව මනෝවිද්‍යාඥයින් විසින් කරුණු අනාවරණය කරන ලදී. එය ප්‍රජානනවාදී ඉගෙනුම් න්‍යායන් වන ගෙස්ටෝල් මනෝවිද්‍යාව, ස්කිමා න්‍යාය, තොරතුරු සැකසුම් න්‍යාය, ප්‍රජානන ව්‍යුහ න්‍යාය, ප්‍රතිවේදාත්මක ඉගෙනුම් න්‍යාය යන න්‍යායන් අතර සුවිශේෂී ඉගෙනුම් න්‍යායකි. 1960 දශකයේ දී ප්‍රජානන මනෝවිද්‍යාඥයෙකු වූ ඔසුබෙල් අර්ථාන්විත ඉගෙනුම් සඞ්කල්පය හඳුන්වා දුණි. අර්ථාන්විත ඉගෙනීමේ ද ඉගෙන ගන්නා කරුණු අර්ථවත් ව එකිනෙකට සම්බන්ධ වන අයුරින් මනෝරටාවන් (Skima) ලෙස මනසෙහි තැන්පත් වේ. ස්මෘතියෙහි පැවති දැනුම සමග නව දැනුම විධිමත් ව ප්‍රජානන ව්‍යුහයට සමාග්‍රහණය වීමෙන් ස්මෘතිය වර්ධනය වේ. අර්ථාන්විත බවින් තොර වනපොත්කරණය ඔස්සේ ගොඩනගා ගන්නා ලද මතුපිට දැනුම ප්‍රජානන ක්ෂේත්‍රයට සමාග්‍රහණය නො වීමෙන් ශීඝ්‍රයෙන් වියැකීමට පත්වේ.

බෞද්ධ ඉගැන්වීමට අනුව මනස ශක්ති ගබඩාවකි. භවයෙන් භවයේ ලබා ඇති අනුභූතීන් ඇසුරින් පෝෂණය වී ඇති මනසෙහි නොයෙකුත් අනුභූතීන් ගබඩා වී පවතී. එය සතිය ලෙස හැඳින්වෙන අතර, සතිය පිහිටුවා ගැනීම මඟින් ස්මෘතිය වර්ධනය වේ. එය ලෞකිකත්වය ඉක්මවා ගිය ආධ්‍යාත්මික විමුක්ති ප්‍රතිලාභය උදෙසා උපයුක්ත වන්නකි. බුදුදහමේ පරම නිෂ්ඨාව පෙළදහම වණපොත් කොට මතකයේ පවත්වා ගනිමින් ප්‍රකාශ කරන්නෙක් නො ව ධර්මානුධර්ම ප්‍රතිපත්ති පූරණයෙන් නිවන් මගට පිළිපන් පුද්ගලයෙකි. මේ සඳහා අර්ථාන්විත ඉගෙනුමක් අවශ්‍ය ය. ස්මෘතිමත් බව සම්මාසතිය ලෙස ථෙරවාද මූලික ඉගැන්වීම්වල සඳහන් වේ. ස්මෘතිය යනු පංචේන්ද්‍රියන් ආශ්‍රයෙන් ග්‍රහණය කරගත් අරමුණු පසු

අවස්ථාවක සිහිපත් කිරීමේ හැකියාව යි. ස්මරණය සඳහා එළඹ සිටි සිහිය හෙවත් සතිමත් බව අවශ්‍ය ය. 'සතිපට්ඨාන' යනු ද සිහිය මැනවින් පිහිටුවීම යි. නමුත් වත්මන් පිරිවෙන් අධ්‍යාපන ක්‍රියාවලියෙහි මෙකී සංසිද්ධිය සිදුවීම ඉතා අවම මට්ටමක පවතී.

සිහියෙහි සතරාකාර පිහිටුවීමක් මහානිද්දෙසයේ දැක්වේ. එනම් රූපකායෙහි කායානුදර්ශනා ස්මෘතිප්‍රස්ථානය, වේදනාවෙහි වේදනානුදර්ශනා ස්මෘතිප්‍රස්ථානය, චිත්තයෙහි චිත්තානුපස්සානා ස්මෘතිප්‍රස්ථානය, ධර්මයෙහි ධර්මානුපස්සනා ස්මෘතිප්‍රස්ථානය වශයෙනි. **මිලින්දපඤ්හයෙහි** සතිය උපදනා ආකාර දාසයක් දැක්වේ. එනම් මනාව දැනීමෙන්, ප්‍රකෘතියෙන් සිහිමුළා වූ නම් ඔහුට සිහිකරවනු පිණිස, ඖළාරික විඥානයෙන්, හිතවිඥාන වශයෙන්, අහිතවිඥාන වශයෙන්, සභාගනිමිත්ත වශයෙන්, විසභාගනිමිත්ත වශයෙන්, කථාභිඥාන වශයෙන්, ලක්‍ෂණ වශයෙන්, සරණ වශයෙන්, මුද්‍රා වශයෙන්, ගණන් වශයෙන්, ධාරණ වශයෙන්, භාවනා වශයෙන්, පොත්කනිබද්ධ වශයෙන්, උපනික්ෂේපන වශයෙන්, ෂඩ් ඉන්ද්‍රියන්ට අනුභූති වශයෙන් සිහි උපදිනා බව දැක්වේ. **විසුද්ධිමග්ගයෙහි** සතිය පැහැදිලි කර ඇත්තේ සිහි කිරීම ලක්‍ෂණ කොට ඇත්තීය යනුවෙනි. "නො මුළාවීම සතියෙහි රසය හෙවත් කෘත්‍යය යි. සිත නිවැරදි අරමුණුවලට යා නො දී රැක ගැනීම පච්චුපට්ඨාන හෙවත් වැටහෙන කාරණය වන්නේ ය" යනුවෙනි. සතියෙහි පිලාපන හා අපිලාපන වශයෙන් ලක්‍ෂණ දෙකක් මාහානිද්දෙසපාළි අටුවාවෙහි දැක්වේ. පිලාපනය යනු දියට දැමූ යමක් පා වී යන්නාක් මෙන් සිතින් සැහැල්ලු අරමුණු විස්මෘත කිරීම යි. අපිලාපනය යනු සිතින් ගත් අරමුණු පා කොට නො යවා පසුව සිහිකිරීම යි. මෙය වනපොත්කරණය ඉගෙනුම් ක්‍රමවේදයෙහි ද පවතී. වනපොත්කරණයෙහි අපිලාපනය නම් ඉගෙනුම් අත්දැකීම් පා කොට නො යවා පවත්වා ගැනීම යි. එය ඔසුබෙල් විසින් පසුකාලීන ව හඳුන්වා දෙන ලද අර්ථාන්විත ඉගෙනුම ලෙස දැක්විය හැකි ය.

**"පතිස්සතිමත්තාය"** හෙවත් එළඹසිටි සිහිය ස්මෘතිය උදෙසා අත්‍යවශ්‍යය ය. මේ පිළිබඳ ව අඞ්ගුත්තරනිකායේ **උච්චඞ්ගපඤ්ඤ, අවකුජ්ජපඤ්ඤ, පුථුපඤ්ඤ** වශයෙන් පුද්ගලයන් තුන්දෙනෙකු ඇසුරින් නිදර්ශන තුනක් දක්වා ඇත. **අනුස්සරධම්ම** සූත්‍රයේ දී ධර්මඥානය වර්ධනය කරගත හැකි ක්‍රමයක් දැක්වේ. බෞද්ධ ස්මෘති උපක්‍රම අතර එය සුවිශේෂී වේ. එනම්;

- **උග්ගහණ** - ඉගෙනීම,
- **ධාරණ** - උගත් දෙය ධාරණය කර ගැනීම,
- **භාසන** - උගත් දෙය අන්‍යයන්ට කියා දීම,
- **සවණ** - නැවත නැවත ශ්‍රවණය කිරීම,
- **පරිපුච්ඡා** - සැක සහිත හෝ ගැටලු සහිත කරුණු ප්‍රශ්න කිරීම,
- **විසජ්ජන** - තමන්ගේ හෝ අන්‍යයන්ගේ ගැටලු හා ප්‍රශ්න විසඳීම, වශයෙනි.

**සතිසූපට්ඨිත** සූත්‍රයෙහි භාවනාව සාර්ථක කර ගැනීම උදෙසා වසිතාවන් 05ක් අනුගමනය කළ යුතු බව දැක්වේ. මෙම වසිතාවන් ද අර්ථාන්විත ඉගෙනුම වර්ධනය පිණිස ඉවහල් වේ. එනම්;

- **ආවජ්ජනවසිතා-** උගත් විෂය කරුණු පසුව මෙනෙහි කිරීම

- **සමාපජ්ජනවසිතා** - පෙර මතකයන්හි පදනම් ව ස්මරණය කිරීමේ හැකියාව
- **අධිට්ඨානවසිතා** - මතකයෙහි ඇති විෂය කරුණු සිහි කැඳවීමේ උත්සුක බව
- **උට්ඨානවසිතා** - නිශ්චිත කාර්යයක් සඳහා එම දැනුම භාවිත කර කාර්යය සාර්ථක කර ගැනීම
- **පච්චවෙක්ඛනවසිතා**- පෙර අද්දැකීම් නැවත නැවත මෙනෙහි කිරීමේ හැකියාව

ස්මෘතිය සංවර්ධනය කරගැනීමට මෙන් ම ස්මෘතිය වියැකීමට හේතුවන කරුණු 06ක් ද පවතී. එය අර්ථාන්විත බවින් තොර වනපොත්කණය ඔස්සේ විෂය කරුණු මතකයේ රඳවා ගැනීම හා සමාන ය. ස්මෘතිය වියැකී යාමට හේතුවන කරුණු නම්,

- **කම්මාරමතා** - නොයෙක් කර්මාන්තයන්හි යෙදීමට ඇති කැමැත්ත,
- **භස්සාරාමතා** - තිරශ්චීන කථාවෙහි යෙදී සිටීමට ඇති කැමැත්ත,
- **නිද්දාරමතා** - නිදාගැනීමට ඇති කැමැත්ත,
- **සඞ්ගණිකාරාමතා** - බොහෝ දෙනා සමඟ එකට සිටීමට ඇති කැමැත්ත,
- **සංසග්ගාරාමතා** - දැකීම ඇසීම ආදී පංචවිධ වූ සංසර්ගය සඳහා ඇති කැමැත්ත,
- **පපඤ්චාරාමතා** - තෘෂ්ණා ආදී කෙලෙස් දහම් සිතේ පැවතීම, වශයෙනි.

පිරිවෙන් අධ්‍යාපන ක්‍රියාවලියෙහි අඩු සාධන මට්ටමක් සහිත සිසුන් බොහෝ විට ඉහත සඳහන් කරුණු හයෙන් එකක් හෝ ඊට වැඩි සඞ්ඛ්‍යාවකින් යුක්ත වේ. එසේ හෙයින් ගුරුවරයා පාඩම ආරම්භ කිරීමට මත්තෙන් සිසුන්ගේ ස්මෘති ස්වභාවය අවබෝධ කර ගනිමින් ගැළපෙන අර්ථාන්විත ඉගෙනුම් ක්‍රමයන් අනුගමනය කළ යුතු ය. එය අර්ථාන්විත වනපොත්කරණය ද විය හැකි ය.

වත්මන් පිරිවෙන් අධ්‍යාපනය ද විභාග කේන්ද්‍රීයව කටයුතු කිරීමේ හේතුවෙන් බොහෝ පැවිදි හා ගිහි සිසුන් විභාග ජය ගැනීම උදෙසා විශේෂ නැඹුරුවක් අධ්‍යාපනයෙහි විද්‍යමාන ය. මෙහි දී පූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකු බිහි කිරීම වෙනුවට විභාග සමත් පුද්ලයෙක් බිහි කිරීමට කටයුතු සිදු වේ. ප්‍රජානන, ආවේදන හා මනෝචාලක ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රජානන ක්ෂේත්‍රයේ පහළ ස්තරයන් ස්පර්ශ කරමින් දැනුම ලබාදීමක් දක්නට ලැබේ. ඒ සඳහා වනපොත්කරණය අර්ථාන්විත බවින් තොර ව යොදා ගැනීමක් පවතී. නමුත් බෞද්ධ වනපොත්කරණ සඞ්කල්පය අර්ථාන්විත ඉගෙනුම් සඞ්කල්පයන්ගෙන් යුක්ත ය.

**පර්යේෂණ නිගමන**

ථෙරවාද බෞද්ධ මූලාශ්‍රයන්ට අනුව වනපොත්කරණ ඉගෙනුම් ක්‍රමවේදය ජනප්‍රිය හා සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රමවේදය වූ බව පැහැදිලි ය. නමුත් එකී වනපොත්කරණ ක්‍රමවේදය අර්ථාන්විත ඉගෙනුම් ක්‍රමවේදයන් ඔස්සේ සකස් වූ බව පැහැදිලි ය. අර්ථාන්විත ඉගෙනුම පිළිබඳ ව ඔසුබෙල්ගේ සොයා ගැනීම්වලට පූර්වයෙන් ථෙරවාද බෞද්ධ ග්‍රන්ථයන්හි ඒ පිළිබඳ ව ගැඹුරින් අදහස් ඉදිරිපත් වී ඇති බවත්

ඵලදායී අර්ථාන්විත ඉගෙනුම් ක්‍රමයක් ලෙස වනපොත්කරණය ථෙරවාද සම්ප්‍රදාය විසින් භාවිත කළ බවත් පැහැදිලි ය.

**ප්‍රමුඛ පදඃ අර්ථාන්විත ඉගෙනුම, වණපොත්කරණය, ස්මෘතිය**

**මූලාශ්‍රය**

**ප්‍රාථමික මූලාශ්‍රය**


- **අඞ්ගුත්තරනිකාය.** (තිකනිපාතය) පුග්ගල සූත්‍රය. (2005). ත්‍රිපිටක බුද්ධජයන්ති ග්‍රන්ථමාලා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **අඞ්ගුත්තරනිකාය iv**. අනුස්සරිතබ්බධම්ම සූත්‍රය. (2005). ත්‍රිපිටක බුද්ධජයන්ති ග්‍රන්ථමාලා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **ඛුද්දකනිකාය.** ධම්මපදපාළිය. සහස්සවග්ග. 101 ගාථාව. (2005). ත්‍රිපිටක බුද්ධජයන්ති ග්‍රන්ථමාලා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **මහානිද්දෙසපාළි** (2006)(2005). ත්‍රිපිටක බුද්ධජයන්ති ග්‍රන්ථමාලා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- ආනන්ද මෛත්‍රිය, බලංගොඩ (සංස්.). (2005). **මිලින්දපඤ්හො.** දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **විසුද්ධිමග්ගො.** (2006). සයිමන් හේවාවිතාරණ සංස්කරණ. කොළඹඃ ත්‍රිපිටක මුද්‍රණාලය.


**ද්විතීයික මූලාශ්‍රය**


- අතුකෝරාළ ඩී.ආර්. (1989). **දහම් අමා.** කොළඹඃ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.
- චන්දවිමල හිමි, ආර්. (1996). **කෙළෙස් එක්දාස් පන්සියය.** පොකුණුවිටඃ ශ්‍රී චන්දවිමල ධර්මග්‍රන්ථ සංරක්ෂණ මණ්ඩලය.
- සුමන හිමි, අතලේ (2015). **සම්භාව්‍ය අධ්‍යාපනයෙහි ලා වනපොත්කරණයේ උපයෝගීතාව.** කොළඹඃ සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.
- සේනාධීර, සිල්වි (2012). **ඉගෙනුම් කාර්යක්ෂමතා වර්ධනය.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.